# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1786/26 - 2012 නොවැම්බර් 30 වැනි සිකුරාදා - 2012.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.- බී 2/1999.

**1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය පනත**

2006 අංක 23 දරන පනතෙන් සංශෝධිත 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 16 වැනි දින,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,
කොළඹ දී ය.

නියෝග

2011 නොවැම්බර් මස 30 වැනි දින අංක 1734/12 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

(1) එම නියෝගවල 6 වැනි නියෝගය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් ;

"6. ජාතික ජලජීවී සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ බලයලත් නිලධරයෙකු විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව කවර හෝ තැනැත්තකු විසින් කෘතිම උපස්ථර ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.";

(2) 6 වැනි නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන නියෝග ආදේශ කිරීමෙන් :-

"6අ. 6 වැනි නියෝගය යටතේ වන අයදුම්පත්‍රයක ආකෘතිය සාරානුකූලව මෙහි 1 වැනි උපලේඛණයේ නිශ්චිතව සඳහන් ආකාරයට විය යුතු ය.

6ආ. 6 වැනි නියෝගය යටතේ ප්‍රදානය කරනු ලබන යම් බලපත්‍රයක්-

(i) අන්සතු කිරීම නොකළ යුතු ය ;

(ii) සාරානුකූලව මෙහි II වැනි උපලේඛණයේ ආකෘතිය අනුව විය යුතු අතර එහි දක්වා ඇති නියමයන්ට සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) එහි 1 වැනි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :-

I වැනි උපලේඛනය

*(6අ නියෝගය)*

***ශ්‍රී ලංකාව තුළ කෘත්‍රිම උපස්ථර ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමේ අයදුම්පත***

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ……………………………………………………………………………
……………………………………………………………………………
……………………………………………………………………………

2. ලිපිනය : ……………………………………………………………………………
……………………………………………………………………………
……………………………………………………………………………

3. ප්‍රවාහනය (ස්ථානය සඳහන් කරන්න) : ………………………………….සිට ………………………………….දක්වා

4. වාහන අංකය : ……………………………………………………………………………

5. අයදුම්කරනු ලබන කාලසීමාව : ………………………………….සිට ……………………………….දක්වාවූ
වලංගු කාල සීමාවකට යටත්ව,

6. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මගින් නිකුත් කරන ලද අනුක්‍රමික අංකය : ………………………………….

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට මම මෙයින් සහතික වෙමි. මෙහි සපයා ඇති තොරතුරු සාදව්‍ය හෝ වැරදි බවට සොයාගනු ලැබුවහොත් මාගේ/අපගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි බවත්, නිකුත් කොට ඇති බලපත්‍රයක් වේ නම් එය අවලංගු කරනු ලැබිය හැකි බවත් මම/අපි දැන සිටින බවට ප්‍රකාශ කරමි/ප්‍රකාශ කරමු.

…………………………
අයදුම්කරුගේ අත්සන.

දිනය : ……………………….

II වැනි උපලේඛනය

*(6ආ නියෝගය)*

***බලපත්‍රයක ආකෘතිය***

*ශ්‍රී ලංකාව තුළ කෘත්‍රිම උපස්ථර ප්‍රවාහනය කිරීම සඳහා වන බලපත්‍රය*

බලපත්‍ර අංකය :.......................................................................

1. ..........................................................හි පදිංචි ..........................................................ට (අයදුම්කරුගේ/ආයතනයේ නම) කෘතිම උපස්ථර අපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහනය කිරීමට මෙයින් බලය පවරනු ලැබේ.

2. කලින් අවලංගු කරනු ලැබුවේ නම් හෝ අත්හිටුවනු ලැබුවේ නම් මිස මෙම බලපත්‍රය .................................සිට ..........................................දක්වා අවලංගු වේ.

3. ප්‍රවාහනය (ස්ථානය සඳහන් කරන්න) ......................................සිට .................................දක්වා

4. වාහන අංකය : ……………………………

5. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මගින් නිකුත් කරන ලද අනුක්‍රමික අංකය } ....................................................

6. මෙම බලපත්‍රය පහත දැක්වෙන නියමයන්ට සහ කොන්දේසිවලට යටත් විය යුතුය.

    (i) මෙහි නම සඳහන් පුද්ගලයා හෝ ආයතනය විසින් පමණක් බලපත්‍රය භාවිත කළ යුතු අතර අන්සතු කිරීම නොකළ යුතුය.

    (ii) 2011 නොවැම්බර් මස 30 වැනි දින අංක 1734/2 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2011 අංක 1 දරන අපනයනය සඳහා කෘතිම උපස්ථරවල ජලජ ජීවීන් වගා කිරීමේ නියෝගයන්හි සඳහන් විධිවිධානවලට අනුකූලව නිකුත් කරනු ලබන අනුක්‍රමික අංකය ඔබ්බවා ඇති කෘතිම උපස්ථර සම්බන්ධයෙන් පමණක් මෙම බලපත්‍රය වලංගු වනු ඇත.

දිනය:.........................                                        ………………………………….

අධ්‍යක්ෂ ජනරාල්.

(4) මෙම නියෝග 2011 නොවැම්බර් මස 30 වැනි දින සිට බලාත්මකව පැවති ලෙසට සලකනු ලැබිය යුතු ය.

12-393

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.